# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2131/61 - 2019 ජූලි මස 13 වැනි සෙනසුරාදා - 2019.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2004/49 හා 2017.02.01 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති ''අ'' උපලේඛනයෙහි අංක 06 සහ 08 යටතේ සඳහන් බලතල පැවරීම ඉවත් කර අනු අංක 06 යටතේ පහත සඳහන් බලතල පැවරීම 2019.07.11 සිට බලාත්මක වන පරිදි ඇතුළත් කරනු ලැබේ.

''අ'' උපලේඛනය

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 6. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික, ද්විතියික හා තෘතීයික මට්ටමේ නිලධරයන් (ආයුර්වේද දෙපාර්තමේන්තුව හැර) | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම<br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2004/49 හා 2017.02.01 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයේ අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ජූලි මස 03 වෙනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

07 - 978

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.